දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617
ලේකම් / செயலாளர் / Secretary: 2784812
කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846
ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாயா"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. ........................................

මගේ අංකය / எமது இல. / My No. ED/3/40/1/1/5

දිනය / திகதி / Date 2013-06- 07

චක්‍රලේඛ අංකං: 26/2013

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
විභාග කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම රජයේ හා අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන්
සියලුම පරිවේණාධිපති හිමිවරුන්

**ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල, ජාතික අධ්‍යාපන ආයතනය හා රජය පිළිගත් වෙනත් තෘතියික අධ්‍යාපන ආයතනවල දේශීය පාඨමාලාවන් හැදෑරීම සඳහා අධ්‍යයන නිවාඩු ලබා දීම**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ජාතික අධ්‍යාපන ආයතනය හා රජය පිළිගත් වෙනත් තෘතියික අධ්‍යාපන ආයතනවල පාඨමාලාවන් පූර්ණකාලීනව හෝ අර්ධකාලීනව හැදෑරීම සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා දීම සම්බන්ධයෙන් මෙතෙක් නිකුත් කර ඇති සියලුම චක්‍රලේඛ අභිබවා මින් ඉදිරියට මෙම චක්‍රලේඛයේ දැක්වෙන නීතිරීති රෙගුලාසි හා විධිවිධාන බලපැවැත්වෙන බව දන්වමි.

1. **අධ්‍යයන නිවාඩු ලැබීමට සුදුසුකම් ලබන නිලධාරීන්**
   1.1. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්
   1.2. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන්
   1.3. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ විදුහල්පතිවරුන්
   1.4. රජයේ පාසල්, රජය අනුමත කරන ලද පිරිවෙන් සහ පෞද්ගලික පාසල්වල ගුරුවරුන් අධ්‍යාපන ක්ෂේත්‍රයට අයත් අනධ්‍යයන කාර්යමණ්ඩල සඳහා, ඒ අයගේ වෘත්තීය අවශ්‍යතාවය අනුව අදාළ පාඨමාලාවන්ට, ආයතන සංග්‍රහය අනුව අධ්‍යයන නිවාඩු ලබා ගත හැකි ය.

2. අධ්‍යයන නිවාඩු ලබා ගැනීමට ඉල්ලුම් කළ හැකි පාඨමාලා - ඇමුණුම අංක 1 හි දක්වා ඇත.

2.1. එහි සඳහන් නොවන අධ්‍යාපනයට සම්බන්ධ පාඨමාලාවක් ඉල්ලුම්කරන්නේ නම් ආයතන ප්‍රධානියා විසින් අදාළ පාඨමාලාව හැදෑරීම පිළිබඳව සාධාරණීකරණයක් තම නිර්දේශය සමග ඉදිරිපත් කළ යුතු ය.

2.2. පූර්ණ කාලීන පාඨමාලා සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගැනීමට නම් එම පාඨමාලා තම දෛනික රාජකාරි සඳහා සෘජුවම අදාළ වීම හෝ සිය තනතුරට අදාළ බඳවා ගැනීමේ උසස් කිරීමේ පරිපාටියකට අදාළ පාඨමාලාවක් විය යුතු ය. අධ්‍යයන නිවාඩු අනුමත කිරීමේ දී එම පාඨමාලා විෂයානුබද්ධ වීම වැඩ ආවරණය පිළිබඳව විදුහල්පති/ පරිවේණාධිපති/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය අත්‍යවශ්‍ය වනු ඇත.

2.3. මෙම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව හදාරනු ලබන පාඨමාලාව අධ්‍යාපන පද්ධතියේ සංවර්ධනය හා නිලධාරියාගේ වෘත්තීය සංවර්ධනය සඳහා දායක වන බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙතින් තහවුරු කර ගැනීමෙන් පසුව නිර්දේශ කළ යුතු ය. පරිවාස කාලයේ පසුවන නිලධාරීන්/ ගුරුවරුන්ට තම සේවා කාලය අවුරුද්දක් සම්පූර්ණ කිරීමෙන් පසුව අධ්‍යයන නිවාඩු ගැනීමේ හැකියාව ඇත.

2.4. ඇමුණුම 1හි සඳහන් පාඨමාලා සඳහා අයදුම් කිරීම ඇමුණුම 2 ආකෘතියට අනුව සිදු විය යුතු ය.

2.5. අදාළ ආයතනයන්ට අනුව අධ්‍යයන නිවාඩු අයදුම්පත් අනුමැතියට යොමු කරන ආකාරය පහත පරිදි වේ.

| නිලධාරියා/ගුරුභවතා | නිර්දේශය | නිර්දේශය | නිර්දේශය | අනුමැතිය |
|---|---|---|---|---|
| ජාතික පාසල්වල සේවය කරන ගුරුභවතුන් | විදුහල්පති | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් |
| ජාතික පාසල්වල සේවය කරන විදුහල්පතිවරුන් | | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් |
| පළාත් පාසල්වල සේවය කරන ගුරුභවතුන් | විදුහල්පති | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් |
| පළාත් පාසල්වල සේවය කරන විදුහල්පතිවරුන් | | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් |
| රජය අනුමත කළ පිරිවෙන් | පරිවේණාධිපති | කෘත්‍යාධිකාරී | | රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් |
| රජය අනුමත කළ පෞද්ගලික පාසල් | කළමනාකරු | | | |
| අනෙකුත් අධ්‍යාපන ආයතනවල සේවය කරන නිලධාරීන් | අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා | | | රේඛීය /පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් |

3. **පූර්ණකාලීන පාඨමාලා සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගැනීම**

3.1. දැනට සේවයේ යෙදී සිටින ගුරුභවතුන් අතරින් විශ්වවිද්‍යාල උපාධිය පූර්ණකාලීනව හැදෑරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශ මත සීමිතව බඳවා ගනු ලබන ගුරුවරුන් සඳහා ද අධ්‍යයන නිවාඩු අයදුම් කළ හැකි ය.

3.2. දැනටමත් පූර්ණ කාලීන වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගන්නා ඉහත අංක 01 යටතේ දක්වා ඇති ගුරුවරුන්/ නිලධාරීන් නැවතත් පූර්ණකාලීන වැටුප් සහිත අධ්‍යයන නිවාඩු සඳහා ඉල්ලුම් කිරීමේ දී බැඳුම්කර කාලසීමාව අවසන් වී තිබිය යුතු ය.

3.3. ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරුවරුන්ට පූර්ණ කාලීන පාඨමාලා සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගත හැක්කේ අනිවාර්ය සේවා කාලය වන අවුරුදු 5ක් සේවය කිරීමෙන් අනතුරුව ය.

3.4. කිසියම් වූ හේතුවක් නිසා පාඨමාලාව තාවකාලිකව නතර වුවහොත් නැවත පාඨමාලාව ආරම්භ කරන තෙක් තම සේවා ස්ථානයට වාර්තා කළ යුතු වේ.

4. **සති අන්ත පාඨමාලා සඳහා ලබා දෙන රාජකාරි නිවාඩු**

4.1. අධ්‍යයන පාඨමාලාවන් වෙනුවෙන් සති අන්තයේ පැමිණෙන්නන්ගේ සේවා ස්ථානයේ සිට අධ්‍යයන මධ්‍යස්ථානයට ඇති දුර කි.මී. 50ට වැඩි නිලධාරීන් සඳහා සති අන්තයට පෙර දින වන සිකුරාදා හෝ පසු දින වන සඳුදා වශයෙන් දින 01ක රාජකාරි නිවාඩුවක් සහභාගීත්වය තහවුරු කිරීමෙන් අනතුරුව හිමි වේ.

4.2. සති අන්ත පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව හදාරණ සියලුම නිලධාරීන් සඳහා සහභාගීත්වය තහවුරු කිරීමෙන් අනතුරුව එම පාඨමාලාව පැවැත්වෙන සති අන්තවල පෙර දින වන සිකුරාදා හෝ පසු දින වන සඳුදා හෝ යන දෙකින් එක් දිනකට රාජකාරි නිවාඩුවක් ලබා ගත හැකි ය. (වර්ෂයකට උපරිම දින ගණන 20කි. වර්ෂයකට අඩු පාඨමාලා සඳහා සමානුපාතිකව බෙදා දින ගණන ගණන් බැලිය යුතු ය.)

4.3. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව (සති අන්ත) හදාරනු ලබන පාසලක සේවය නොකරන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ට හා ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන්ට එම පාඨමාලාවේ ප්‍රායෝගික ඉගැන්වීම් අදියර සඳහා සති දහයක (10) අධ්‍යයන නිවාඩුවක් හිමි වේ.

5. **ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පාඨමාලා හදාරනු ලබන නිලධාරීන්ට පහත දැක්වෙන පරිදි අධ්‍යයන නිවාඩු හිමි වේ.**

5.1. අධ්‍යයනය ලබන කාල සීමාව තුළ පාඨමාලා පැවැත්වෙන දින අනුව මසකට එක් දිනක් බැගින්

5.2. විභාගය සඳහා අංක 6 අනුව කටයුතු කෙරේ.

5.3. විවෘත විශ්වවිද්‍යාලයේ විද්‍යා උපාධිය හදාරන නිලධාරීන්/ ගුරුවරුන් සඳහා ඉහත 5.1 හි සඳහන් නිවාඩුව අවශ්‍යතාවය අනුව මසකට දින කිහිපයක් ලෙස වුව ද ලබා ගත හැකි අතර, එක් අධ්‍යයන වර්ෂයක් සඳහා හිමිවන උපරිම නිවාඩු දින ගණන දහය (10)කි.

## 6. විභාග සඳහා නිවාඩු

6.1. සති අන්ත එක් අවුරුදු පාඨමාලා හදාරණ නිලධාරීන්ට, පාඨමාලාවේ අවසන් පරීක්ෂණයට සූදානම් වීම සඳහා විභාගය පවත්වන දිනයන් ද ඇතුළුව දෙනු ලබන අධ්‍යයන නිවාඩුව විභාගය පැවැත්වෙන කාලසීමාව තුළ හෝ විභාග පූර්ව ලෙස දින විස්ස (20) ක උපරිමයකට යටත්ව (සති අන්ත හා විශේෂිත නිවාඩු දින හැර වැඩ කරන දින) ලබා ගත හැකි ය.

සමාසික පරීක්ෂණ (semester) ක්‍රමය යටතේ පාඨමාලා හදාරන අයට ද ඉහත දින විස්ස (20) අනුපාතිකව ලබා ගත හැක.

6.2. වර්ෂ 2ක සති අන්ත පාඨමාලාවන් සඳහා වාර්ෂිකව විභාග පැවැත්වෙන්නේ නම් දින දහය (10) බැගින් අවස්ථා දෙකක දී ද වර්ෂ තුනක (3) ක සති අන්ත පාඨමාලාවන් සඳහා වාර්ෂිකව විභාග පැවැත්වෙන්නේ නම් දින දහය (10) බැගින් අවස්ථා තුනක දී (3) මෙම නිවාඩු ලබා ගත හැක. වසර දෙක (2) /තුන (3) අවසානයේ පමණක් විභාගය පැවැත්වේ නම් ඒ සඳහා දින විස්සක (20)ක නිවාඩුව පමණක් ලබා ගත හැකි වේ.

6.3. ආයතනික ගුරු පුහුණුව හදාරණ උපාධිධාරී නොවන නුපුහුණු ගුරුවරුන් සඳහා වන අවසාන පරීක්ෂණය ඔවුන්ගේ ගුරු විද්‍යාල කාලසීමාවෙන් පසුව පාසලක සේවය කරද්දී පැවැත්වුවහොත් එම අවසාන පරීක්ෂණයට සූදානම් වීම සඳහා විභාග කාලසීමාවට පූර්වෝක්ත සති දෙකක(02) අධ්‍යයන නිවාඩුවක් ලබා දීමට හැකි ය.

6.4. විභාග සඳහා අධ්‍යයන නිවාඩු ලබා සිටිද්දී කිසියම් නොවැලැක්විය හැකි හේතුවක් නිසා විශ්වවිද්‍යාලය හෝ අදාළ ආයතනය විසින් විභාග කල් දැමීම සිදු වුවහොත් වහාම සේවයට වාර්තා කළ යුතු අතර, විභාග කාලසටහන ඉදිරිපත් කළ පසු නැවත ලබා ගත හැක්කේ ඉතිරි වූ නිවාඩු දින ගණන පමණි.

## 7. අධ්‍යයන නිවාඩු අනුමත කිරීමේ ක්‍රියා පිළිවෙත

7.1. අධ්‍යයන නිවාඩු ලබා ගැනීමට අවම වශයෙන් සතියකට පෙර තම අධ්‍යයන නිවාඩු ඉල්ලුම්පත්‍රය දෙපාර්තමේන්තු ප්‍රධානියා/ විදුහල්පති නිර්දේශ සහිතව අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබිය යුතු ය. ඒ සමගම මාස හය (06)කට වැඩි පාඨමාලා සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 43/88 අනුව ගිවිසුම් පත්‍රය සම්පූර්ණ කර ලබා දිය යුතු ය.

7.2. පාඨමාලාව අයදුම් කරනු ලබන නිලධාරියාගේ රාජකාරි ආවරණය සඳහා සුදුසු ගුරුවරයෙක්/ නිලධාරියෙක් නම් කර තිබිය යුතු අතර වැටුප් සහිත අධ්‍යයන නිවාඩු අනුමත කිරීම/ නිර්දේශ කිරීම 2.5 වගුව අනුව සිදු කිරීමට වග බලා යුතු ය.

7.3. අධ්‍යයන නිවාඩු ලබා ගන්නා ගුරුවරුන්/ නිලධාරීන් තම පැමිණීමේ සහතික අදාළ ආයතනවලින් ලබා ගෙන තම ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු වේ. පාඨමාලාව හදාරා අවසානයේ අදාළ ආයතනයෙන් ලබා ගත් ප්‍රතිඵල සටහන, නිවාඩු අනුමත කළ බලධාරියාට ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොකරන අයට ලබා ගත් නිවාඩු වැටුප් රහිත නිවාඩු කාලසීමාවක් ලෙස සලකා කටයුතු කළ යුතු වේ.

7.4. එක් වැටුප් සහිත අධ්‍යයන නිවාඩුවකින් පසුව ආයතන සංග්‍රහයෙහි XII හි 14.6 වගන්තිය පරිදි, අනිවාර්ය සේවා කාලයක් සේවය කළ යුතු වන අතර නැවත අධ්‍යයන නිවාඩුවක් ඉල්ලුම් කළ යුතු වන්නේ එම කාල සීමාව සේවයේ යෙදීමෙන් අනතුරුව ය.

7.5. අධ්‍යයන නිවාඩු අනුමත කිරීමෙන් පසු අනිවාර්ය සේවා කාලය ඉක්මවීමට පෙර විශ්‍රාම ගියහොත්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/97 අනුව කටයුතු කළ යුතු වේ.

7.6. වැටුප් සහිත අධ්‍යයන නිවාඩු අනුමත කළ හැකි උපරිම කාලය අදාළ පාඨමාලාවේ කාලයට සීමා වේ. වැටුප් රහිත අධ්‍යයන නිවාඩු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන බල පැවැත්වේ.

7.7. එකවර පාඨමාලා දෙකක් හැදෑරීම සඳහා අධ්‍යයන නිවාඩු ලබා දිය නොහැක.

7.8. අදාළ කාලසීමාවට සරිලන සේ නිවාඩු අනුමත ලිපිය නිකුත් කිරීමෙන් පසු අධ්‍යයන නිවාඩු ලබා ගැනීමට පෙර ආයතන සංග්‍රහයේ XII හි 14.4 හා XV පරිච්ඡේදයේ 4.1 පරිදි ගිවිසුම් හා බැඳුම්කර අත්සන් කර සේවයෙන් නිදහස් වීමේ ලිපියක් ලබා ගත යුතු ය. එම ලිපිය ඉදිරිපත් කරන අය පමණක් පාඨමාලා සඳහා ලියාපදිංචි කර ගත යුතු බවට අදාළ ආයතනවලට උපදෙස් දෙනු ලැබේ.

7.9. සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගන්නා නිලධාරියෙකු සම්පූර්ණ කළ යුතු බැඳුම්කර කාලසීමාවේ උපරිමය ඔහුගේ විශ්‍රාම යන දිනය දක්වා විය යුතු ය.

7.10. පාඨමාලාලාභියාගේ පාලනයෙන් පරිබාහිර වූ අවස්ථාවල දී බලධාරියාගේ නිර්දේශය මත පමණක් අධ්‍යයන නිවාඩු කාලය දීර්ඝ කිරීමට සහ මෙම චක්‍රලේඛය අනුව අර්ථකථනයන් ලබා දීමේ බලය අධ්‍යාපන ලේකම්වරයාට ඇත.

එස්.එම්. ගෝඨාභය ජයරත්න
අධ්‍යාපන ලේකම්

2013.06. 07
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය, බත්තරමුල්ල

පිටපත්:

1. රජයේ අනුමත සියලුම විශ්වවිද්‍යාල හා වෙනත් තෘතියික අධ්‍යාපන ආයතන
2. විගණකාධිපති
3. පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්
4. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
5. අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්
6. ප්‍රධාන කොමසාරිස්, ගුරු අධ්‍යාපන
7. අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
8. ගණකාධිකාරිවරුන්
9. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්
10. ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්

## උපලේඛනය

මේ යටතේ ඉල්ලුම් කළ හැකි පාඨමාලාවන් පහත දක්වා ඇති අතර ඒවා "අධ්‍යාපනය" පිළිබඳ වීම හෝ තම සේවාවන්ට සෘජුවම අදාළ වන පාඨමාලා විය යුතු ය.

1. අධ්‍යාපනය පිළිබඳ ආචාර්ය උපාධිය (දර්ශනශූරි)

2. අධ්‍යාපන හෝ අධ්‍යාපන පරිපාලනය පිළිබඳ අධ්‍යාපන දර්ශනපති, අධ්‍යාපනපති සහ සමාන හෝ ඊට ඉහළ මට්ටමේ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලා

3. විවිධ විෂයන් ඉගැන්වීමට අදාළ විද්‍යාපති උපාධි පාඨමාලා සහ සමාන පාඨමාලා
   - 3.1. විද්‍යාව ඉගැන්වීම පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව
   - 3.2. තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව
   - 3.3. ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව
   - 3.4. භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව
   - 3.5. අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව
   - 3.6. අධ්‍යාපනයට අදාළ වෙනත් විද්‍යාපති පාඨමාලාවන්
   - 3.7. ප්‍රසාංගික කලාපති පාඨමාලාව (සෞන්දර්යය විශ්වවිද්‍යාලය)
   - 3.8. ශාස්ත්‍රපති පාඨමාලා (කැළණිය විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන වාග් විද්‍යා ශාස්ත්‍රපති ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලාව සඳහා ඉංග්‍රීසි භාෂා ගුරුවරුන්ට)

4. ප්‍රථම උපාධි පාඨමාලා
   - 4.1. අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව (ජාතික අධ්‍යාපන ආයතනය)
   - 4.2. ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව (ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කොමිෂන් සභාව මගින් තෝරාගනු ලබන අයට)
   - 4.3. අධ්‍යාපන තාක්ෂණවේදී උපාධි පාඨමාලාව (ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම) (වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය)
   - 4.4. අධ්‍යාපන තාක්ෂණවේදී උපාධි පාඨමාලාව (තාක්ෂණික විෂයයන් ඉගැන්වීම) (වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය)
   - 4.5. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පිළිබඳ තාක්ෂණවේදී උපාධිය (මෘදුකාංග තාක්ෂණය) (වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය)
   - 4.6. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පිළිබඳ තාක්ෂණවේදී උපාධිය (බහු මාධ්‍ය හා වෙබ් තාක්ෂණය) (වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය)
   - 4.7. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය (ජාලකරණ තාක්ෂණය) (වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය)
   - 4.8. විද්‍යා/ කලා/ වාණිජ හා අධ්‍යාපනයට අදාළ අනෙකුත් ප්‍රථම උපාධි පාඨමාලා

5. අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා ප්‍රයෝජනවත් වන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා
   - 5.1. අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
   - 5.2. අධ්‍යාපන කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ වූ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
   - 5.3. නාට්‍යකරණය ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
   - 5.4. අධ්‍යාපන මාර්ගෝපදේශ හා උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
   - 5.5. තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව
   - 5.6. ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව
   - 5.7. දෙවන භාෂාවක් වශයෙන් ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව

6. අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා ප්‍රයෝජනවත්වන ඩිප්ලෝමා පාඨමාලාවන්
   - 6.1. පාසල් කළමනාකරණ ඩිප්ලෝමාව
   - 6.2. ප්‍රාථමික පාසල් කළමනාකරණ ඩිප්ලෝමාව

6.3. විදුහල්පතිත්වය පිළිබඳ ඩිප්ලෝමාව ( පුහුණු පාඨමාලාව)

6.4. නොවිධිමත් අධ්‍යාපනය/ විදේශ භාෂා අධ්‍යාපනය/ විශේෂ අධ්‍යාපනය/ පුස්තකාල හා තොරතුරු (විඥාපන) විද්‍යාව/ ගුරු පුස්තකාලයාධිපති/ ආගමික අධ්‍යාපනය ඇතුළු ඉගැන්වීම් හා අධ්‍යාපන ක්‍රම

6.5. ජනමාධ්‍ය පාඨමාලාව

6.6. තාක්ෂණ විෂය අධ්‍යාපනය (කෘෂිකර්මය/ උද්‍යාන පාලනය/ සත්ත්ව පාලනය/ සමුද්‍ර ජීව සම්පත් තාක්ෂණය/ ගොඩතර ජලාශ ජීව සම්පත් තාක්ෂණය/ ආහාර විද්‍යාව හා තාක්ෂණය/ ගෘහ ආර්ථික විද්‍යාව/ හස්ත කර්මාන්තය/ ඉදිකිරීම් තාක්ෂණය/ විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණය/ කලා ශිල්ප/ යාන්ත්‍රික තාක්ෂණය/ මොටර් යාන්ත්‍රික ශිල්පය)

6.7. ශාරීරික අධ්‍යාපන පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව/උසස් පුහුණුකරු ඩිප්ලෝමා පාඨමාලාව (ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය)

6.8. සෞන්දර්යය අධ්‍යාපනය (චිත්‍ර/නර්තනය (භරත/ සිංහල) සංගීතය (පෙරදිග/ අපරදිග/ කර්ණාටක)

6.9. නාට්‍යකරණය හා රංග කලාව/ සාහිත්‍ය (සිංහල/දෙමළ/ ඉංග්‍රීසි/ ආරාබි)/ සාහිත්‍ය රාසාස්වාදනය

6.10. අතිරේක භාෂා සංවර්ධන පාඨමාලාව

6.11. තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

6.12. සමාජ සේවා විද්‍යාල මගින් පූර්ණ කාලීනව පවත්වන දෙවසරක සමාජ සේවා ඩිප්ලෝමා පාඨමාලාව

6.13. වෙනස් හැකියාවන් සහිත සිසුන්ට ඉගැන්වීම සඳහා වන ඩිප්ලෝමා පාඨමාලාව (රාගම වෛද්‍ය පීඨයේ වෙනස් හැකියාවන් සහිත සිසුන් සඳහා ඉගැන්වීමේ අධ්‍යයන ඒකකය මගින් පවත්වනු ලබන)

7. මීට අමතරව අදාළ ඉල්ලුම්කරු තම සේවා සැපයීමේ දී අදාළවන විශේෂිත විෂය පථයන් සම්බන්ධ ඩිප්ලෝමා පාඨමාලාවන්

8. අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා ප්‍රයෝජනවත් වන සහතික පත්‍ර පාඨමාලා

ඇමුණුම 2

වැටුප් සහිත අධ්‍යයන නිවාඩු අයදුම්පත්‍රය

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ට, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන්ට, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ විදුහල්පතිවරුන්ට, රජයේ පාසල්වල හා රජය අනුමත කරන පෞද්ගලික පාසල්වල ගුරුවරුන්ට පිරිවෙන් ගුරුවරුන්ට ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයන් හා වෙනත් තෘතියික අධ්‍යාපන ආයතනවල පාඨමාලාවන් හැදෑරීම සහ විභාගවලට පෙනී සිටීම සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු

1. (අ) සම්පූර්ණ නම සිංහලෙන්: ..........................................................................

..........................................................................................

(ආ) මුලකුරු සමග නම සිංහලෙන්: ..........................................................

(ඇ) සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්: ..............................................

..........................................................................................

(ඈ) මුලකුරු සමග නම ඉංග්‍රීසියෙන්: ........................................................

2. (අ) තනතුර සහ ශ්‍රේණිය: ..................................................................

(ආ) මුල් පත්වීමේ දිනය: ....................................................................

(ඇ) පත්වීම් වර්ගය (උදා: උපාධිධාරී/ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා) ..............................

(ඈ) පත්වීම ස්ථිර කර තිබේ ද?: ..............................................................

(ඉ) රාජකාරියට සම්බන්ධ විෂය ක්ෂේත්‍රය: ....................................................

3. (අ) උපන් දිනය: - අවුරුද්ද: ..........මාසය: ................ දිනය: ..................

(ආ) ස්ත්‍රී/ පුරුෂ භාවය: .......................

(ඇ) ජාතික හැඳුනුම්පත් අංකය: .....................................

4. පෞද්ගලික ලිපිනය: ..........................................................................

..........................................................................................

5. දුරකතන අංක: ස්ථාවර:......................... ජංගම:.............................

6. සේවා ස්ථානයේ නම හා ලිපිනය: ............................................................

..........................................................................................

7. අධ්‍යාපන වෘත්තීය සුදුසුකම්:..............................................................

8. වෘත්තීය සුදුසුකම්: ....................................................

9. (අ) සේවා කාලය: අවු: .................. මාස:...................... දින: ...................

10. ගුරු පුහුණු පාඨමාලා වෙනුවෙන් බැඳුනු ඇපකර කාල පරිච්ඡේද

| පාඨමාලාව | පාඨමාලාවේ කාලය | | බැඳුම්කරයේ කාලය | |
|---|---|---|---|---|
| | සිට | දක්වා | සිට | දක්වා |
| | | | | |
| | | | | |

11. මීට පෙර වැටුප් සහිත/ රහිත අධ්‍යයන නිවාඩු ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර

| පාඨමාලාව | පාඨමාලාවේ කාලය | | බැඳුම්කරයේ කාලය | |
|---|---|---|---|---|
| | සිට | දක්වා | සිට | දක්වා |
| | | | | |
| | | | | |

12. දැනට ඔබ ගුරු විද්‍යාලයක, විද්‍යාපීඨයක ජාතික අධ්‍යාපන ආයතනයේ පාඨමාලාවක් හදාරන්නේ ද?
(පාඨමාලාව, එය ආරම්භ වූ දිනය, ඇතුළත් වූ දිනය, ගුරුවිද්‍යාලයේ නම සඳහන් කරන්න)
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

13. විශ්වවිද්‍යාලයේ/ ආයතනයේ දී ඔබ හැදෑරීමට නියමිත අධ්‍යයන පාඨමාලාව

13.1. පාඨමාලාවේ නම: ..........................................................................

13.2. මාධ්‍යය: ...............................................

13.3. පාඨමාලාවේ ආරම්භක දිනය: ...................................

13.4. පාඨමාලාවට නියමිත කාල පරිච්ඡේදය: ......................................

13.5. අධ්‍යයන නිවාඩු අවශ්‍ය කාලසීමාව: ................... සිට ........................ දක්වා

පසුගිය වසර පහක කාලය තුළ මා කිසිදු විනය චෝදනාවකට ලක්වී නොමැති බවත් ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් මෙයින් ප්‍රකාශ කරමි.

දිනය: ...............................  ...........................................

අයදුම්කරුගේ අත්සන

**විදුහල්පති/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය:**

ඉහත නම සඳහන් ගුරුවරයා/ ගුරුවරිය/ විදුහල්පති/ නිලධාරියා/ නිලධාරිනිය ............................... වැනි දින සිට මේ දක්වා මෙම විදුහලේ/ ආයතනයේ අඛණ්ඩව සේවයේ යෙදී සිටින බවත් ඔහුට ඇයට අවසන් වරට 20.. වැනි මාසයේ විදුහලේ කාර්යාලයේ වැටුප් ලේඛනයෙන් වැටුප් ගෙවූ බවත්, එම ගුරුවරයාට/ ගුරුවරියට/ විදුහල්පතිට/ නිලධාරියාට/ නිලධාරිනියට ඉහත සඳහන් කාලසීමාව සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු අනුමත කිරීම නිර්දේශ කරන/ නොකරන බවත් දන්වා සිටිමි.මෙම නිලධාරියාගේ/ ගුරුවරයාගේ රාජකාරි කටයුතු ආවරණය සඳහා සුදුසු වැඩපිළිවෙලක් යොදා ඇති බව තහවුරු කරමි.

දිනය: විදුහල්පති/ ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව

**නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය:**

ඉහත නම් සඳහන් ගුරුවරයා/ ගුරුවරිය/ විදුහල්පති/ නිලධාරියා/ නිලධාරිනියට විරුද්ධව පසුගිය වසර පහ තුළ කිසිදු චෝදනාවක් නොමැති බවත්, රාජකාරි ආවරණය සඳහා යොදා ඇති වැඩපිළිවෙල පිළිබඳ සෑහීමකට පත්විය හැකි බවත්, ඉහත ඉදිරිපත් කර ඇති සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි. ........................................ සිට ........................................ දක්වා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු නිර්දේශ කරමි./නොකරමි.

දිනය: .................................  ...........................................

ක.අ.අ. /නි.අ.අ.ගේ අත්සන හා නිලමුද්‍රාව

**පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය**

ඉහත නම් සඳහන් ගුරුවරයා/ ගුරුවරිය/ විදුහල්පති/ නිලධාරියා/ නිලධාරිනියට විරුද්ධව පසුගිය වසර පහ තුළ කිසිදු චෝදනාවක් නොමැති බවත්, ඉහත ඉදිරිපත් කර ඇති සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි. ..................................................... සිට ........................................ දක්වා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු නිර්දේශ කරමි./නොකරමි.

දිනය: ..................................

..................................................

ප.අ.අ.ගේ අත්සන හා නිලමුද්‍රාව

*සැලකිය යුතුː ආකෘති පත්‍රයේ සඳහන් සියළු තොරතුරු සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.